සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# නර්තනය

**13 ශ්‍රේණිය** **කාලය පැය 03 යි.**

## I කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **ගැලපෙන පිළිතුරට අදාළ අංකය තිත් ඉර මත ලියන්න**

---

(01) තාල සංකල්පය මත ගණිතමය ලක්‍ෂණ ඇතුලත්ව ගොඩනැගුණු වචන ඇතුලත් වන්නේ,
(1) මාත්‍රා, තිත, රටා, ප්‍රස්තාරකරණය (2) තිත, ලය, ආවර්තය, ප්‍රස්තාරකරණය
(3) තාලය, අවකාශය, ලය, සම්බන්ධතා (4) තාලය, විභාග, මාත්‍රා, රටා
(5) තිත, තාලය, වාදනය, ලය (......)

(02) පහතරට සම්ප්‍රදායේ එන වන්නම් ගණන වන්නේ,
(1) 12 (2) 18 (3) 32 (4) 14 (5) 16 (......)

(03) පාද දෙකෙහි විලුධ අතර පරතරය ඇඟිලි තුනක පමණ තබාගෙන දෙදණ අර්ධ වශයෙන් පහත්ව සිටීමේ ඉරියව්ව,
(1) මැණ්ඩිය (2) නමස්කාරය (3) අර මණ්ඩිය
(4) පද පහත්තිය (5) මුලු මණ්ඩිය (......)

(04) රවීන්ද්‍රනාත් තාගෝර් තුමා නිෂ්පාදනය කළ නෘත්‍ය නාටකයක් හා එතුමා පිහිට වූ කලායතනය වන්නේ,
(1) ශාප් මෝඩන් සහ ශාන්ති නිකේතනය
(2) ශාප් මෝඩන් සහ කේරල කලා මණ්ඩලය.
(3) කල්පනා සහ කේරල කලා මණ්ඩලය.
(4) ජීවනයේ රිද්මය සහ කලා ක්‍ෂේත්‍රය.
(5) කල්පනා සහ කලා ක්‍ෂේත්‍රය. (......)

(05) තෙල්මේ හා වාහල නැටීම යන නර්තන දෙක දැකිය හැකි වන්නේ,
(1) උඩරට ගම් මඩුවේ (2) පහතරට දෙවොල් මඩුවේ
(3) සබරගමු පහන් මඩුවේ (4) පහතරට දෙවොල් මඩුවේ
(5) උඩරට ගී මඩුවේ (......)

(06) කැළණියවිශ්ව විද්‍යාලයට අනුබද්ධව තිබූ සෞන්දර්ය අධ්‍යයන ආයතනය ස්වාධීන විශ්ව විද්‍යාලයක් බවට පත් වූ වර්ෂය වන්නේ,
(1) 2005 (2) 2006 (3) 2003 (4) 2000 (5) 2002 (......)

(07) එරන්දතී වර්ණනාවේ සහ රත්තෙලඹු වර්ණනාවේ එන කවි යොදා නිර්මාණය වී ඇති ගැමි නැටුම් දෙකක් වන්නේ,
(1) පන් නෙලීමේ නැටුම සහ මෝල් ගස් නැටුම
(2) පන් නෙලීමේ නැටුම සහ කුළු නැටුම
(3) ගොයම් නැටුම සහ කුළු නැටුම
(4) තාලම් නැටුම සහ ගොයම් නැටුම
(5) ගොයම් නැටුම සහ කළගෙඩි නැටුම (......)

(08) විසිවන සියවසේ නිර්මාණය වූ නවතම වන්නම් කිහිපයකි,

(1) සමනල වන්නම, හංස වන්නම, මහ බෝ වන්නම

(2) සමනල වන්නම, රති රාග වන්නම හා මණ්ඩූක වන්නම

(3) සිරිකත වන්නම, රති රාග වන්නම හා මණ්ඩූක වන්නම

(4) මන්තිරි වන්නම, ඇගලුම් වන්නම, ගුරු දේව වන්නම

(5) සේරා වන්නම, මරගන වන්නම හා මන්තිරි වන්නම (......)

(09) ලෝක නර්තන දිනය වශයෙන් නම් කර ඇත්තේ,

(1) පෙබරවාරි 26 (2) ජනවාරි 31 (3) ජනවාරි 27 (4) අප්‍රේල් 27 (5) අප්‍රේල් 29 (......)

(10) අනුපිළිවෙලින් සොකරි, කෝලම් හා නාඩගම් වල එන චරිත තුනකි,

(1) සොකරි, කාලි, පරයා (2) කාලි, නොන්චි, සෙල්ලන්ලමා

(3) පච්චමීරා, නොන්චි, අප්පුහාමි (4) ආඬිගුරු, ලෙන්චිනා, හෙන්ඩා

(5) පච්චමීරා, කෝළමා, අන්නවිරාල (......)

- **පහත ප්‍රශ්න වලට පිළිතුරු අදාළ හිස්තැනෙහි සටහන් කරන්න.**

(11) කේරල ග්‍රාම දේවා පූජා සඳහා නර්තනය දැක්වීමේ මුල් උරුමකරුවන් ලෙස ................................ හැඳින්වේ.

(12) වර්ෂ 661 ප්‍රංශයේ XIV වන ලුවී රජ විසින් .......................................................... නම් වෘත්තිය නර්තන ආයතනයක් ආරම්භ කරන ලදී.

(13) භරත නාට්‍යම් සන්දර්ශනයකදී ප්‍රථම වරට තාත්වික අභිනය ..................... නමැති අංගයේ දී දැකගත හැකිය.

(14) උඩරට නැටුමේ මුහුණට මුහුණලා තරගකාරීව බෙර වැයීම ........................................... වාදනයේ දී සිදු වේ.

(15) රත්නපුර සමන් දේවාල පෙරහැරේ සුවිශේෂී ලෙස ගමන් කරන අංගයක් වන ........................... විශේෂ වේ.

(16) උඩරට නර්තන සම්ප්‍රදායේ වට්ටම් හතරේ ලක්ෂණ අන්තර්ගත වී ඇති දීර්ඝතම නර්තනාංගය ....................................................... වේ.

(17) කරදිය මුද්‍රා නාට්‍යය ........................................................................................................ මහතාගේ නිර්මාණයකි.

(18) මහා සම්මත රජ බිසවගේ දොළ දුක සංසිඳවීමට ප්‍රථම වරට ................................................. රඟ දක්වන ලදී.

(19) ශරීරයේ උපාංග කොටස් භාවිතයේ දී හැඟීම් ඉස්මතු වන්නේ .................................................... අභිනයේදී ය.

(20) වන්නම්, හටන් කාව්‍ය, රාජ ස්තෝත්‍ර ගායනා වූයේ ......................................................................... මඩුවේ ය.

- බලි ශාන්ති කර්මයේ දී බලි ඇඳුරා අත දරන්නේ,

(21) ........................................................................ (22) ..........................................................................

- කථකලි නර්තනයේ පහත පැළඳුම් භාවිතා කරන්නේ කොහේට ද?

(23) කිරීටම් ..........................................................................................................

(24) චිලංග ..........................................................................................................

- හංසවිල මුද්‍රා නාට්‍යයේ පහත චරිත නිරූපණය කළේ,

(25) සංගීත අධ්‍යක්ෂක ..........................................................................................................

(26) කුමාරයාගේ චරිතය ..........................................................................................................

- නවාබ් වජිඩ් අලීෂා සහ මීනාක්ෂි සුන්දරම් පිල්ලේ යන අය කුමන නර්තන සඳහා දායකත්වය සැපයූවෝ ද?

(27) නවාබ් වජිඩ් අලීෂා ..........................................................................................................

(28) මීනාක්ෂි සුන්දරම් පිල්ලේ ..........................................................................................................

- වෙස් මෝස්තර නිර්මාණයේ දී භාවිතා කෙරෙන මූලික කොටස් දෙක වන්නේ,

(29) .......................................................................... (30) ..........................................................................

- භරත නාට්‍යම් හි තාල වාද්‍ය භාණ්ඩය හා එය වාදනය කරන්නා හඳුන්වන්නේ කෙසේ ද?

(31) .......................................................................... (32) ..........................................................................

- හේවිසි වාදනය සඳහා යොදාගන්නා ප්‍රධාන වාද්‍ය භාණ්ඩ දෙක මොනවා ද?

(33) .......................................................................... (34) ..........................................................................

- දඹදෙණි සහ කුරුණෑගල යුගවලට අයත් භාණ්ඩ නාම ලේඛන දැක්වෙන ග්‍රන්ථ දෙක කවරේ ද?

(35) ..........................................................................................................

(36) ..........................................................................................................

- පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායේ කාන්තාවන් වෙනුවෙන් කරනු ලබන යාග දෙක මොනවා ද?

(37) පහතරට ..........................................................................................................

(38) සබරගමු ..........................................................................................................

- ලී කෙළි හා කුළු නැටුම් වලට සමාන ද්‍රවිඩ නැටුම් මොනවා ද?

(39) ලී කෙළි ..........................................................................................................

(40) කුළු ..........................................................................................................

e තක්සලාව The National e-learning Portal for the General Education

## II කොටස

- **ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

01. උදාර වන්නමේ කවි පද දෙකක්, කස්තිරම හා අඩව්ව ප්‍රස්ථාර ගත කරන්න. (ලකුණු 12)

02. (i) බලි ශාන්තිකර්මයේ එන ගායනයක් ලියන්න.
(ii) නව ග්‍රහයින් නම් කරන්න.
(iii) බලි ශාන්තිකර්මය පිළිබඳව කෙටි විස්තරයක් සපයන්න. (ලකුණු 12)

03. (i) සතර අභිනය නම් කරන්න.
(ii) සතර අභිනය හා දේශීය නර්තන සම්ප්‍රදායේ එන සම්බන්ධය විස්තර කරන්න. (ලකුණු 12)

04. ගැමි නාටක වල එන චරිත නිරූපණය සොකරි නාටකය ඇසුරින් පහදන්න. (ලකුණු 12)

05. නර්තන කලාවේ ඉතිහාසය තුළ කොළඹ යුගය විශේෂ වන ආකාරය පහදන්න. (ලකුණු 12)

06. ''කරදිය මුද්‍රා නාට්‍යය කලාත්මක භාවයෙන් අනූන නිර්මාණයකි.'' අගයන්න. (ලකුණු 12)

(මුළු ලකුණු 60)

The National e-learning Portal for The General Education